# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2447/56 – 2025 අගෝස්තු මස 01 වැනි සිකුරාදා – 2025.08.01**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/COM/01/2024/65.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.12.20 දිනැති හා අංක 2415/65 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2024.12.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතලේ, පලාපත්වල, කෝන්ගහමුල, අංක 8/295 හි පදිංචි අයි.ඩී. විජේමාන්න මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, මලලසේකර මාවත, අංක 17 හි පිහිටි පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/71/2024 හා 2025.06.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුලි මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05.


1A – G 045014 – 18 (2025/08)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ සහ කාර්මික අධිකරණ ශාඛාවේදීය

නඩු අංකය A/71/2024
යොමු අංකය IR/COM/01/2024/65

අයි.ඩී. විජේමාන්න මිය,
අංක 8/295,
කෝන්ගහමුල,
පලාපත්වල,
මාතලේ.

*පළමු පාර්ශ්වය*

සහ

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය,
අංක 17,
මලලසේකර මාවත,
කොළඹ 7

*දෙවන පාර්ශ්වය*

**අතර පවත්නා කාර්මික ආරාවුල**

**බලතල පැවරීම**

කම්කරු අමාත්‍ය මහාචර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතාගේ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 17 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියේ තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2024 දෙසැම්බර් 11 වන දිනැති නියෝගයෙන් මා පත්කොට මා වෙත යොමු කොට ඇත.

**ආරාවුලට හේතු වූ කරුණු**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ සේවයේ නියුතු අයි. ඩී. විජේමාන්න මිය MA-4 වැටුප් තලයේ නොපිහිටුවීමෙන් ඇයට අසාධාරණයක් සිදු වී තිබේද, යන්නත් එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් එයට හිමිවිය යුතු සහන කවරේද සහ කවරදා සිටද යන්නත් පිළිබඳව වේ.

**පළමු පාර්ශ්වයේ ස්ථාවරය**

පළමු පාර්ශ්වය වූ ඉල්ලුම්කාරිය වන අයි.ඩී. විජේමාන්න මිය 2013 වර්ෂයේ පවත්වන ලද සම්මුඛ පරික්ෂණයෙන් පසු වැඩසටහන් නිළධාරි (මූල්‍ය කළමනාකාරණ) තනතුරට බඳවා ගෙන ඇති බවත් වර්තමානය දක්වා එම තනතුරේ සේවය කරන බවත් 2014 නව බඳවා ගැනීම් පටිපාටිය මගින් එහි ඇමුණුම් 2 හි සඳහන් වැඩසටහන් නිලධාරි තනතුරට පත්වූ බවත් අදාල තනතුරට වැටුප් කේතය MA-4 බවත් තමාට ලැබුනේ MA-3 වැටුප බවත්ය. එබැවින් වැඩසටහන් නිළධාරි (මූල්‍ය කළමණාකාර) තනතුරේ රැඳෙමින් තමාගේ තනතුරට හිමි වැටුපට වඩා අඩු වැටුපක් ලබමින් සේවයේ නිරත වීමට සිදු වීමෙන් තමාට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බවය.

**දෙවන පාර්ශ්වයේ ස්ථාවරය**

ඉල්ලුම්කාරිය බඳවා ගැනීමේදි MA- 3 වැටුප් තලයේ පිහිටුවා සිටි බැවින් ඇයගේ තනතුරු නාමය වැඩසටහන් සහකාර බවත් ඒ අනුව ඇයගේ වැටුප් කේතය MA-3 බැවින් ඉල්ලුම්කාරිය ඉල්ලා සිටි සහනය දිය නොහැකි බවය. විසඳිය යුතු ප්‍රශ්නය

01) පළමු පාර්ශ්වය වූ ඉල්ලුම්කාරිය වන අයි.ඩී. විජේමාන්න මියගේ ස්ථිර තනතුර කුමක්ද ?

02) එම තනතුරට හිමි වැටුප කුමක්ද?

03) නොලැබීමට බලපෑ හේතු මොනවාද?

දෙපාර්ශ්වය විසින් විස්තර ප්‍රකාශ ඉදිරිපත් කර ඇති අතර මෙම ආරාවුල පිළිබඳ විභාගයන් 2025.02.11, 2025.03.19 යන දින වල විභාග කර ඇත. පළමු පාර්ශ්වය වූ ඉල්ලුම්කාරිය නීතිඥ ඕ. එල්. ප්‍රේමරත්න මහතා සමඟ පෙනී සිටි, දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් අභ්‍යන්තර විගණක කුසල් ලොකුහෙට්ටිම මහතා වැඩබලන පරිපාලන නිලධාරි එම්.ජී.පී.එස්.ආර්. පතිරණ මහත්මිය සහ පරිපාලන අමාත්‍යාංශයේ නිතිඥ කේ. ආර්. සෙනෙවිරත්න මහත්මිය සහ නීතිඥ ගයනි ප්‍රේමතිලක මහත්මිය පෙනී සිටි ඉල්ලුම්කාරිය සාක්ෂි දෙමින් පැ.1 සිට පැ. 14 දක්වා ලේඛන ලිඛිත සාක්ෂි ලෙස ඉදිරිපත් කර ඇත. දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂිකරුවන් ඉදිරිපත් නොකළ අතර ඉල්ලුම්කාරියගෙන් සාක්ෂි විමසා සිටි අතර වි. 1 ලේඛනය ඉදිරිපත් කර ඇත.

ඉල්ලුම්කාරිය සාක්ෂි දෙමින් තමන් 2008.09.15 දින පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ පිළිගැනීම් නිලධාරිය ලෙස සේවයට පැමිණි බවත් වසර 02 කින් පසු ගිණුම් අංශයට මාරු කළ බවත් එම කාලයේ අදාල අංශයේ ගිණුම් කටයුතු කළ බවත් ප්‍රකාශ කරයි. පළමුවන පාර්ශ්වයේ නිතිඥ මහතාගේ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් 2013 ආයතනය විසින් පළකරන ලද පුවත් දැන්වීම (පැ (1) 53 පිටුව) (ආ) ඡේදය යටතේ තමාට සුදුසුකම් තිබූ බවත් ඒ අනුව තමා ඉල්ලුම් කළ බවත් ප්‍රකාශ කරයි. පැවති සම්මුඛ පරීක්ෂණයෙන් පසු 2013.05.08 දිනැතිව තමාට පත්වීම ලැබුනු බවත් ප්‍රකාශ කරයි. (පැ. 14 71 පිටුව) එහි ඉල්ලුම්කාරියගේ තනතුර ලෙස Post of programmer officer (Financial Management) එම ලිපියේ

2.0 We are pleased to inform you that you are selected for the post of programme officer (Financial Management) in this institute w.e.f 15th May 2013.

එම ලිපියේ,

4.0 You will be placed in grade MA 3-2006 on the initial salary point in the salary scale of බව සඳහන් වේ. ඒ සමඟම ලබාදෙන ලද රැකියා විස්තරයෙහි (පැ. 2 56 පිටුව) එහි නිළධාරියාගේ නම එම්.ඩී.අයි.ජී. විජේමාන්න මිය, තනතුරු නාමය වැඩසටහන් නිලධාරි, සේවා ගණය MA-3 ලෙස සඳහන් වේ. ආයතනය විසින් එහි අධ්‍යක්ෂක ඩී.එම්. සුරතිස්ස මයා විසින් ඉරේෂා විජේමාන්න මිය අමතමින් නීති අංශයේ රාජකාරි ඉටු කිරීමට යන මැයින් 2021.10.25 යවන ලද ලිපියේ ඇයගේ තනතුර වැඩසටහන් නිලධාරි ලෙසද Consultant (FM) තනතුරේ රාජකාරි ආවරණය කරන ලෙස දන්වමින් 2015 ජුනි 16 අධ්‍යක්ෂ කස්තූරි අනුරාධනායක විසින් යවන ලද ලිපියේ තනතුර Programme Officer ලෙස සඳහන් වූ බව ප්‍රකාශ කරයි. 2023.01.30 දිනැතිව පළාත් පාලන ශ්‍රී ලංකා ආයතනයේ නමින් යවන ලද (පැ. 7. 62 පිටුව) ලිපියේ තනතුරු වැඩසටහන් නිළධාරී ලෙස සඳහන් වන බව ප්‍රකාශ කරයි.

පත්වීම් ලිපියේ Salary scale MA-3 ලෙස සඳහන් වන බව ද කළමණාකාර සේවා දෙපාර්තමේන්තුව විසින් 2013.01.11 දිනැතිව නිකුත් කරන ලද (පැ. 5, 34 පිටුව) බඳවා ගැනීම් පටිපාටියේ තනතුරු 26 ක් සඳහන් වූ බවද එහි අංක 19 යටතේ MA-4 ලෙස සඳහන් වන බවද ප්‍රකාශ කරයි. තමාට හිමි වැටුප් කේතය නොලැබීම පිළිබඳ අභියාචනයට පිළිතුරු ලෙස අධ්‍යක්ෂක සූරතිස්ස දිසානායක විසින් තමා වෙත එවන ලද ලිපියේ ඉරේෂා විජේමාන්න මිය වැඩසටහන් සහකාර ලෙස සඳහන් කර ඇති බව ප්‍රකාශ කරයි. එමෙන්ම පළමු පාර්ශ්වයේ නීතිඥ මහතාගේ ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකාරිය 2023 දක්වා වැඩසටහන් නිලධාරි ලෙස ලබා දුන් බවත් 2023 පසුව වැඩසටහන් සහකාර ලෙස තනතුරු ස්වභාවය වෙනස් කර ඇති බවත් 2014 පටිපාටිය හඳුන්වා දීමෙන් පසුව 2023 ප්‍රථම වතාවට වැඩසටහන් සහකාර ලෙස හඳුන්වා ඇති බවත් කියයි. තනතුර වෙනස් කිරීම ක්‍රමවේදයකින් තොරව ආයතනයේ එවකට සිටි අධ්‍යක්ෂක මහතා තනතුරු නාමය වෙනස් කර බවත් ප්‍රකාශ කරයි. 2014 හඳුන්වා දුන් පටිපාටියේ වැඩ සටහන් නිළධාරී තනතුර සඳහා විශ්වවිද්‍යාලයෙන් ලබාගත් උපාධි සහතිකයක් තිබිය යුතු බව මෙම පටිපාටියේ සඳහන් වන බැවින් තමාට MA-4 නොලැබෙන බව ආයතනය විසින් ඉදිරිපත් කරන ලද පිළිතුරු ප්‍රකාශයේ සඳහන් වන බව ප්‍රකාශ කරයි. 2021 වර්ෂයේ වාණිජවේදී උපාධිය ලබාගත් බවත් එය ඉදිරිපත් කර වැටුප් තලයක පිහිටුවන ලෙස ඉල්ලා සිටියද (පැ. (10) 64 වන පිටුව) එම ඉල්ලීමට ද MA-4 වැටුපෙහි පිහිටුවිය නොහැකි බවත් කළමනාකාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය අරගෙන ඉදිරියේ දී සම්මුඛ පරීක්ෂණයෙන් බඳවා ගන්නා බවත් (65 පිටුව) ප්‍රකාශ කළ බව කියා සිටි. තමාට හිමි වැටුප් තලය ලැබීමට තමාට විතරක් කොන්දේසි 2 ක් ඉදිරිපත් කළ බවද (පැ (11) 44 පිටුව) ප්‍රකාශ කරයි. දැනට තමාට හිමි වැටුප් කේතයට අනුව උසස්වීම් ලබා ගැනීමට නොහැකි වන බවද සාක්ෂි කාරිය ප්‍රකාශ කරයි. 2013 ලැබූ මුල් පත්වීමෙන් පසු කිසිදු පත්වීම් ලිපියක් නොලැබුණු බවද ප්‍රකාශ කරයි.

දෙවන පාර්ශ්වයේ හරස් ප්‍රශ්න වලදී වාණිජ ඩිප්ලෝමා සහතිකය පිළිබඳ ප්‍රශ්නකර ඇත. එහිදී සාක්ෂිකාරිය තමාට උසස් ඩිප්ලෝමා සහතිකය තිබෙන බව ප්‍රකාශ කරයි. සහතිකයේ තිබෙන්නේ කළමණාකරන ඩිප්ලෝමාවක් බවත් එය උසස් ජාතික ගණකාධිකාරි ඩිප්ලෝමාව සහ වාණිජ ඩිප්ලෝමාව පසුව කළමණාකාර ඩිප්ලෝමාවක් ලෙස වෙනස් කළ බව ප්‍රකාශ කරයි. අදාල පුවත්පත් දැන්වීමේ එක් සුදුසුකම් වූ ගිණුම් අංශයේ වසර 2 ක පළපුරුද්ද පිළිබඳ සාක්ෂිකාරියගෙන් ප්‍රශ්න කළ අතර තමා වසර 2 ක් ගිණුම් අංශයේ සේවය කළ බව එවකට සිටි අධ්‍යක්ෂතුමා දන්නා බැවින් පළපුරුදු සහතික නොඉල්ලූ බව සඳහන් කරයි. (141 පිටුව)

ප්‍ර : පිළිගැනීමේ නිලධාරි තනතුරේ ඉඳගෙන ඔබ ගිණුම් පිළිබඳ පළපුරුද්දක් ඉදිරිපත් කළේ.

පි : පළපුරුද්ද සහතික ඉදිරිපත් කරලා නැහැ. මම වැඩකරපු නිසයි. ආයතනයේ අධ්‍යක්ෂකතුමා හිටියේ මම ඉස්සෙලාම බඳවාගන්න කොට 2011 හිටපු අධ්‍යක්ෂකතුමා ඉන්න ඇත්තේ ඒ වෙනකොට ඒ අධ්‍යක්ෂකතුමා දන්නවා මම ඒකේ වැඩ කලා කියලා. ඒ අධ්‍යක්ෂකතුමා හමීඩ් සර් කියන එක්කෙනා එයා දන්න නිසා වෙන්න ඇති මගෙන් එහෙම ලිවුමක් ඉල්ලුවේ නැත්තේ.

සමස්ත සාක්ෂි විමසීමේදී ඉදිරිපත් වූ ලේඛන සහ ලකුණු කරන ලද ලේඛන අනුව ඉල්ලුම්කාරියගේ රැකියා තනතුර කුමක්ද යන්න නිරීක්ෂණයට භාජනය කළෙමි. පැ. 2, පිටුව 26, පැ. 3 පිටුව 32, පැ. 4. පිටුව 33, පැ.14 පිටුව, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය විසින් පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කාරිය පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වැඩසටහන් නිලධාරී මූල්‍ය කළමණාකරු බව ද ආයතනය පිළිගෙන ඇත. 2014 වැටුප් සංශෝධනය සමඟ තම තනතුරට හිමි වැටුප් කේතය ලබා නොදීම පිළිබඳ ඉල්ලුම්කාරිය විසින් කරන අභියාචනයට පිළිතුරු වශයෙන් ආයතනයේ අධ්‍යක්ෂක සුරතිස්ස දිසානායකගේ 2023.01.30 - 2023.08.30 (පැ. 7 සහ 8 (45 පිටුව) ඉල්ලුම්කාරිය වැඩසටහන් සහකාර ලෙස හඳුන්වා ඇත. මෙමගින් අදාල වැටුප් කේතය ලබාදීම සඳහා කළමණාකාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගත යුතු බව පැ (11) මගින් දන්වා ඇත.

මෙම ලිපිය ඇය වෙත ලබා දෙනුයේ වැටුප් සංශෝධනය වී වසර 9 කට පසුව ඉල්ලුම්කාරිය විසින් ඉදිරිපත් කරන ලද අභියාචනයට පිළිතුරු වශයෙනි. 2013.05.08 වන දින නිකුත්කර ඇති පත්වීම් ලිපියේ

2.0 We are pleased to inform you that you are selected for the post of programme officer (Financial Management) in this institute w.e.f. 15th May 2013

මෙම පත්වීම් ලිපිය පැරණි බඳවා ගැනීම් පටිපාටිය මත සකස් කළ එකක්ද නව පටිපාටිය අනුව සකස්කළ එකක්දැයි කිසිම පාර්ශ්වයක් සනාථ කර හැත. පත්වීම් ලිපියේ

4.0 අනුව grade MA3-2006
Rs. 187,200 - 5,580 x 10-2, 880 x 4-3,840 x 15- 4,320 x 7 - 312,432 per annum
(Rs. 15,600/- Per month)

වැටුප් සංශෝධන කිරීමේ දී සෑම සේවකයෙකුටම එම සංශෝධනය අනුව තනතුර, වැටුප් කේතය සඳහන් ලිපියක් ලබාදිය යුතුය. පැ. 5 ලේඛනයේ, 2 අනුව මෙම ආයතනයේ දැනට සිටින සේවකයින් මෙම තනතුරුවලට අන්තර්ග්‍රහණය කිරීමේදී ඇමුණුම් 1 උපලේඛනයේ දැක්වෙන අයුරින් සහ ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදය 4 වන වගන්තිය අනුව නව වැටුප් ව්‍යුහයන්ට අන්තර්ග්‍රහණය කිරීම සිදුකළ යුතුය. මෙම ලිපියේ 5 අනුව තනතුරක් උත්ශ්‍රේණිගත කිරීම නිර්දේශ කර ඇති විටදී බඳවා ගැනීමේ පටිපාටිය සහ උසස්වීමේ ක්‍රම සංශෝධනයෙන් පසුව අවශ්‍ය සුදුසුකම් මත දැනට තනතුරු දරන්නා එම නව තනතුරට පත්කිරීමට /උසස් කිරීම සලකා බැලිය යුතුය. එසේ පත්කරනු නොලබන්නේ නම් දැනට සිටින තනතුර සහ වැටුප් පරිමාණය ඔහුට පමණක් පෞද්ගලික වන සේ පවත්වාගෙන යායුතුය. මෙම ලිපියේ තනතුරු 59 ක් සඳහන් වන අතර වැඩසටහන් නිලධාරී අනු අංක 18,19 වැටුප් කේතය MA-4 ලෙස සඳහන් වේ. ඉල්ලුම්කාරිය මේ වන විට වැඩසටහන් නිලධාරී තනතුරේ පිහිටුවා ඇත. මෙම ලිපියේ උපදෙස් ක්‍රියාත්මක කළ බවට දෙවන පාර්ශ්වය කරුණු ඉදිරිපත් කර නැත. පුවත්පත් දැන්වීමක් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා විධිමත් පත්වීම් ලිපියක් ලබාදී තිබියදී මේ අවස්ථාවේදී සුදුසුකම් විමසීම උචිත නොවේ. අදාල පත්වීම් ලිපිය හා ලකුණු කරන ලද පැ. 2, පැ.3, පැ. 5. පැ. 14 පළමු පාර්ශ්වය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වැඩසටහන් නිලධාරි (මූල්‍ය කළමනාකරු) බව තහවුරු වේ.

2013.08.03 දිනැති පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂක සුරතිස්ස දිසානායක මහතාගේ අත්සනින් යුතු පැ 8 ලිපියද නිකුත් කරනුයේ පළමු පාර්ශ්වය කරන ලද අභියාචනයකින් පසුවයි. තනතුරක් පහත හෙළීම කාර්මික ආරාවුල් පනතේ 48 වන වගන්තිය අනුව කාර්මික ආරාවුල අර්ථ නිරූපණයේ සේවා කොන්දේසි පිළිබඳ ආරාවුලකි.

අදාළ තනතුරට හිමි වැටුප් කේතය කුමක්ද යන්න විමසීමට ලක් කළෙමි. පැ.1 ලෙස ඉදිරිපත් කර ඇති, පුවත්පත් නිවේදනයේ වැඩසටහන් නිලධාරී තනතුරු 3 ක් සඳහා අයදුම්පත් කැඳවා ඇත.

1. වැඩසටහන් නිලධාරී (ඉංජිනේරු)
2 වැඩසටහන් නිලධාරී (මූල්‍ය කළමණාකරු)
3. වැඩසටහන් නිලධාරී (පර්යේෂණ)

අදාළ තනතුරු සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය එක් සුදුසුකමක් පමණි. අදාළ තනතුරු 3 සඳහා වැටුප් පරිමාණය එකම වේ. Rs. 187, 200-2,580 x 10-2,880 x 4-3,840 x 15-4,320 x 7-312, 432 per annum (Rs. 15,600/- per month) වැඩ සටහන් නිලධාරී (ඉංජිනේරු) සහ වැඩසටහන් නිලධාරී (පර්යේෂණ) වැටුප් කේතය කුමක්ද යන්න දෙවන පාර්ශ්වය කරුණු ඉදිරිපත් කර නැත.

පැ 5 ලෙස ලකුණු කර ඉදිරිපත් කර තිබූ කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් එන්. ගොඩකන්ද මහතාගේ නමින් නිකුත් කර තිබූ 2013.01.11 දිනැති DU/E4/49/7/381/I/Vol. I අංක දරන කළමණාකාර සේවා අංක 30 චක්‍රලේඛනයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය යන මාතෘකාව යටතේ පළාත් සභා අමාත්‍යාංශය වෙත යවන ලද ලිපියේ සඳහන් තනතුරු 59 ඇතුලත

අනු අංක 18 වැඩසටහන් නිලධාරි (පර්යේෂණ) MA-04
අනු අංක 19 වැඩසටහන් නිලධාරි MA-4
අනු අංක 22 වැඩසටහන් නිලධාරි MA-3 ලෙස සඳහන් වේ. (35 පිටුව)

මෙම ලිපිය සමඟ ඉදිරිපත් කර ඇති ඇමුණුම් 1 හි (41 පිටුව)
Sri Lanka Institute of Local Governance Restructuring යටතේ,
Programme Assistant Approved initial salary (MSD 25) 10,550 Appropriate Salary(MSD 25) 10,550 Approprate Salary step (MSD 30) 15,240 එම ලේඛනයේ වැඩසටහන් නිලධාරි තනතුරක් සඳහන් නොවේ.

පළමු පාර්ශ්වය ඉදිරිපත් කළ පැ. 8 ලේඛනය එනම් අධ්‍යක්ෂක සූරතිස්ස මහතා විසින් ඉල්ලුම්කාරිය වෙත යවන ලද ලිපියේ 3 වන ඡේදය ඒ අනුව දැනට ඔබ පිහිටා සිටින MA-3 වැටුප් තලයට අදාළ තනතුරු නාමය " වැඩසටහන් සහකාර " යන්නයි. නමුත් ඉහත සටහනින් ඔබ " වැඩසටහන සහකාර " බව ඔබට නැවතත් දන්වා සිටීමි.
මෙම ලිපිය අනුව,
වැඩසටහන් නිලධාරී වැටුප් කේතය MA-4
වැඩසටහන් සහකාර වැටුප් කේතය MA-3 බව කළමණාකාර අධ්‍යක්ෂ සහතික කර ඇත. එමෙන්ම මෙම ලිපිය මගින් වැඩසටහන් නිලධාරී ලෙස ඔබව හඳුන්වා ඇති බව ඉල්ලුම්කාරියට දන්වා ඇත. නමුත් ආයතනය විසින් දෙන ලද පත්වීම් ලිපි හා නීති අංශයේ වැඩ පැවරීම් ලිපිය හා පැ. 3 (පිටු අංක 32) පැ. 4 ලෙස ලකුණු කර ඇති (පිටු අංක 34) ලිපිය Covering up of duties for the post of consultant (FM) අධ්‍යක්ෂ සූරතිස්ස මයා විසින්ම ඉල්ලුම්කාරිය වැඩසටහන් නිලධාරී ලෙස හඳුන්වා ඇත.

මෙම ඉල්ලුම්කාරියට පත්වීම් ලිපිය ලබාදී ඇත්තේ 2013.05.08 වන දිනය පැ. 5 ලෙස සලකුණු කර ඇති DMS/E4/49/7/381/1/ Vol.l දරන කළමණාකාර සේවා අංක 30 චක්‍රලේඛනයේ විධිවිධාන ක්‍රියාත්මක වන ලිපිය 2013.01.11 දින නිකුත් කර ඇති අතර ඉන් පසුව නිකුත් කර ඇති පත්වීම් ලිපියට වැඩසටහන් නිලධාරී වැටුප් කේතය MA-3 ලෙස සඳහන් වූයේ ඇයි ද යන්න ගැටලුවකි. අදාළ ලිපියේ වැඩසටහන් නිලධාරී තනතුරට අදාළ වැටුප් කේතය MA- 4 ලෙස සඳහන් වේ. ආයතන ධූරාවලියේ MA-4 Programme Officer තනතුරු 3 ක් සඳහන් වේ. පැ. 13 (පිටු අංක 51) අදාළ තනතුරු සමාන තනතුරු ලෙසද වැටුප් සහකාර පහළ තනතුරක් ලෙසද සඳහන් වේ. ධූරාවලියේ සමාන තනතුරු සමාන වැටුප් තලයක පිහිටිය යුතුය. ඉල්ලුම්කාරියගේ සාක්ෂි (පිටුව 59)

ප්‍ර : මහත්මියගේ තනතුරේ සේවය කරන අනෙකුත් නිලධාරීන්ට MA-4 කියන වැටුප් කේතය ලැබෙනවා ?

උ : ඔව්

ප්‍ර : මහත්මියට සිදුවෙලා තිබෙන අසාධාරණය තමයි තමන්ගේ තනතුරේ වැඩ කරන අයට MA-4 වැටුප් කේතය ලැබෙන විට මහත්මියට පමණක් MA-3 වැටුප් කේතය ලැබෙන්නේ ?

උ : ඔව්
දෙවන පාර්ශ්වයේ නීතිඥ මහත්මියගේ හරස් ප්‍රශ්න වලට උත්තර දෙමින් (පිටුව 145)
ප්‍ර : එතකොට මහත්මිය සහ ආයතනය අතර මේ පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි වලට අනුව යම්කිසි ගිවිසුමක් හටගෙන තිබෙන බව මහත්මිය පිළිගන්නවාද?
පි : පිළිගන්නවා
ප්‍ර : එතකොට ඒ ගිවිසුමේ සඳහන් වන පරිදි මහත්මියට ලැබුණු තනතුර කුමක්ද?
පි : වැඩසටහන් නිලධාරි මූල්‍ය කළමණාකරණ
ප්‍ර : ඒ සඳහා එකඟවෙලා තිබුණ වැටුප් කේතය කුමක්ද?
පි : MA 3 වැටුප් කේතය තමයි මට දුන්නේ

මෙම තොරතුරු අනුව වැඩසටහන් නිලධාරී තනතුරට හිමි වැටුප් කේතය MA-4 බව පැහැදිලි වේ. අදාළ වැටුප් තලයේ නොපිහිටුවීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කර ඇත

දෙවන පාර්ශ්වය ඉදිරිපත් කළ සාක්ෂි හා උත්තර ප්‍රකාශන මත 2014.10.01 අනුමත වූ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වැඩසටහන් නිලධාරි බඳවා ගැනීමේ පටිපාටියට VI (පිටු අංක 181) වැඩසටහන් නිලධාරි තනතුර සඳහා පිළිගත් විශ්වවිද්‍යාලයක සුදුසුකම් තිබිය යුතුය. මෙම ඉල්ලුම්කාරියට එම සුදුසුකම නොමැති බැවින් MA-4 වැටුප් කේතයේ පිහිටුවිය නොහැකි බවත් සඳහන් වේ. සහතික පිළිබඳ ආයතනය විසින් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයෙන් විමසීම 2016 දී සිදුකළ බවට ලිපිය V2 ලෙස ඉදිරිපත් කර ඇත. එම ලේඛනය බේරුම්කරණ ඉදිරියේ ඉදිරිපත් නොකළේ ඇයි ද යන්න ප්‍රශ්නයකි. ඉල්ලුම්කාරියගේ සුදුසුකම් පිළිබඳව දෙවන පාර්ශ්වයේ නීතිඥ මහත්මිය විමසීමක් කළ අතර ඉල්ලුම්කාරිය ප්‍රකාශකළේ මේ වන තෙක් තමාගෙන් සුදුසුකම් පිළිබඳ විමසීමක් සිදු නොකළ බවයි පත්වීම් ලබා වසර 12 කට පසු මෙම විමසීම යුක්ති සහගත නොවේ. ඉල්ලුම්කාරියට අසාධාරණයක් වී නොමැති නම් අනෙකුත් වැඩසටහන් නිළධාරීන්ගේ වැටුප් සංකේත ඉදිරිපත් කළ යුතුය.

2014.10.01 දිනැති කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛන අංක 30 විධිවිධාන ක්‍රියාත්මක කිරීම අධ්‍යක්ෂ ජනරාල්ගේ 2013.01.11 දිනැති DMS/E4/49/7/381/1/Vol.1 දරන ලිපිය මගින් අනුමත තනතුරු සඳහා ජාතික වැටුප් කොමිෂන් සභාව විසින් නිර්දේශිත HM 2-2. HM 1-3, HM1-1, MM 1-3, JM 1-1, MA 4, MA 1-1, PL 3 සහ PL 1 යන වැටුප් කේත වලට අදාළ සේවා සනයන්හි තනතුරු සඳහා අනුමත කළ බඳවා ගැනීමේ පටිපාටි ලිපියේ තුන්වන ඡේදයේ "සියලු බඳවා ගැනීම් හා උසස්වීම් මෙම පටිපාටියන්හි සඳහන් විධිවිධාන අනුව සිදුකළ යුතු බවද දැනට සේවය යෙදී සිටින සේවකයින් අන්තර්ග්‍රහණය කිරීම, බඳවා ගැනීමේ පාටිපාටිවල සඳහන් පූර්ව අවශ්‍යතා සපුරා ඇති අයුරින් හා මගේ අංක DMS/E4/49/7/381/ 1/ Vol-1 ක හා 2013.01.11 දිනැති ලිපියේ සඳහන් කොන්දේසි වලට යටත්ව සිදුකළ යුතු බවත් දුරටත් කාරුණිකව දන්වමි'' යනුවෙන් සඳහන් වේ.

මෙම ලිපිය මගින් තනතුරු පහත හෙලීමක් ගැන සඳහන් නොවේ මෙම ලේඛනයේ MA-4 වැටුප් කේතය සඳහා නියමිත තනතුරු වලට සුදුසුකම් දක්වා ඇත. එහි

5.1. Qualifications: (General)
Programmer Officer (research/Programmer Officer
External:

මෙම සුදුසුකම් බාහිර අපේක්ෂක සඳහා බව සඳහන් කර ඇති අතර පැරණි සේවකයන් සඳහා බලපාන ආකාරය සඳහන් කර නැත. දෙවන පාර්ශ්වය විසින් එය තහවුරු කර නැත.

මේ අනුව පළමු පාර්ශ්වය වන M.D.I.D. විජේමාන්න මහත්මිය 2013.5.7 පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වැඩසටහන් නිලධාරී මූල්‍ය කළමණාකරු ලෙස 2013 ස්ථිර පත්වීමක් ලබා සේවය කර ඇත.

2013.5.15 සිට වැඩසටහන් නිලධාරි තනතුර සේවය කර ඇත. එයට අදාළ වැටුප කේතය MA-3 සඳහන්ය. නමුත් 2014 නව බඳවා ගැනීම් පටිපාටියට අනුව වැඩසටහන් නිලධාරි තනතුරට අදාළ වැටුප් කේතය MA-4 ලෙස සඳහන් වේ. ආයතනය මෙහිදී තනතුරට අදාළ වැටුප කේතය ලබා දෙනු වෙනුවට තනතුර පහත හෙලා ඇත. මෙයින් අදාළ ඉල්ලුම්කාරියට අසාධාරණයක් සිදුවී ඇත. ආයතනය මෙයට හේතු ලෙස දක්වා ඇත්තේ නව බඳවා ගැනිම් පටිපාටියට අදාළ වැඩ සටහන් නිලධාරි තනතුරට අදාළ සුදුසුකම් නොමැති බැවින්

වැටුප් කේතය ලබා නොදුන් බවය. නව බඳවා ගැනීම් පටිපාටියට අලුතෙන් බඳවා ගනු ලබන බාහිර හා අභ්‍යන්තර ඉල්ලුම්කරුවන්ට අදාළ වන බවයි. ආයතනය එම තනතුරු වල සේවය කරන අයට බලපාන අයුරු සඳහන් නොවේ.

දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති V2 ලේඛණය අදාළ වනුයේ බාහිර අයදුම්කරුවන්ට බව තහවුරු වේ.

**ප්‍රදානය**

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ වැටුප් සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය අනුව 2014.10.01 සිට වැඩසටහන් නිලධාරි මූල්‍ය කළමණාකාර අයි.ඩී. විජේමාන්න මිය MA-4 වැටුප් සනයේ පිහිටුවන ලෙස නියෝග කරමි.

අධිකරණයේ දැනුම්දීම් මත පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කාරිය නියමිත තනතුරේ පිහිටුවහොත් ලැබිය යුතු හිඟ පඩි පිළිබඳ ලේඛණයක් 2025.02.11 දින පළමු පාර්ශ්වය අධිකරණයට ඉදිරිපත් කළ අතර එය නිවැරදි බව දෙපාර්ශ්වය පිළිගන්නා ලදී.

Salary details Summery

| Year | Received Salary - MA3 | Requested Salary - MA-4 | Difference |
|---|---|---|---|
| From October to December 2014 | 86,334.00 | 95,028.00 | 8,694.00 |
| 2015 | 428,213.66 | 462,426.00 | 34,212.34 |
| 2016 | 446,379.48 | 482,682.00 | 36,302.52 |
| 2017 | 449,475.48 | 487,938.00 | 38,462.52 |
| 2018 | 452,567.60 | 493,194.00 | 40,626.40 |
| 2019 | 467,111.81 | 536,391.00 | 69,279.19 |
| 2020 | 515,392.33 | 596,805.00 | 81,412.67 |
| 2021 | 520,739.03 | 605,865.00 | 85,125.97 |
| 2022 | 586,079.03 | 674,925.00 | 88,845.97 |
| 2023 | 591,419.03 | 683,985.00 | 92,565.97 |
| 2024 | 701,759.02 | 802,520.00 | 100,760.98 |
| To Feb. 2025 | 129,790.00 | 148,500.00 | 18,710.00 |
| **Total** | **5,375,260.00** | **6,070,259.00** | **694,998.53** |

ඒ අනුව ඉල්ලුකාරියට නියමිත වැටුප්තලයේ නොපිහිටවීමෙන් අහිමි වූ හිඟ පඩිය 694.998.53 (හයලක්ෂ අනූ හතරදහස් නවසිය අනූ අටයි සත පනස් තුනයි) ඉල්ලුම්කාරියට ලබාගත හැකිවෙන සේ මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවූ දින සිට එක් මසක් ඇතුලත මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස මම නියෝග කරමි.
මෙය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බවට මම ප්‍රකාශ කරමි.

**එච්. ආර්. එල්. සුගතදාස**
බේරුම්කරු

2025 ජූනි මස 06 වැනි දින,
කොළඹ.

බේරුම්කරන සහ කාර්මික අධිකරණයේ දීය.

EOG 08-0007

මගේ අංකය :IR/Com/01/2024/37.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.04.04 දිනැති හා අංක 2430/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.03.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කැළණිය, කොහොල්විල පාර, අංක 365 හි පදිංචි මලිදු සඳරුවන් ජයසූරිය මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් ගාල්ල, උණවටුන, යද්දෙහිමුල්ල පාර හි පිහිටි තම්බපණ්ණි ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/22/2025 හා 2025.06.23 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජූලි මස 21 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 05

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී

බේරුම්කරු ඕබඩගේ ලීලාරත්න මැතිතුමන් ඉදිරියේදීය.

මලිදු සඳරුවන් ජයසූරිය මයා,
අංක 365,
කොහොල්විල පාර,
කැලණිය.

ආරවුල් අංකය - IR/COM/01/2024/37 *පළමු පාර්ශ්වය*

සහ

බේරුම්කරණ අංකය -A/22/2025

තම්බපණ්ණි ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්,
යද්දෙහිමුල්ල පාර,
උණවටුන,
ගාල්ල.

*දෙවැනි පාර්ශ්වය*

අතර පවත්නා කාර්මික ආරාවුල.

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත දැක්වෙන කාර්මික ආරාවුලට හේතු පාදක වී ඇත්තේ.

“තම්බපණ්නි ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ ප්‍රධාන සූපවේදී වශයෙන් සේවය කළ මලිඳු සදරුවන් ජයසූරිය යන අය හට 2022 මාර්තු සිට 2022 සැප්තැම්බර් මස දක්වා ඔහුගේ පත්වීම් ලිපියේ එකඟ වූ සම්පූර්ණ වැටුප නොගෙවා දීමනා ආදිය ඉවත්කර අඩු වැටුපක් ගෙවීම මගින් ඔහුට යම් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ.”

**පෙනී සිටීම**

පළමු පාර්ශ්වය වෙනුවෙන් නීතිඥයකු හෝ නියෝජිතයකු පෙනීසිටියේ නැත. ඉල්ලුම්කරු තනිව පෙනීසිටි.
දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් - නීතිඥ ආර්. ඩබ්. එම් පොඩිනිලමේ මහතා සමඟ සමූහ කළමනාකරු ප්‍රියංග කාරියවසම් මහතා පෙනී සිටී.

දෙපාර්ශ්වය විසින්ම මෙම ආරාවුල සම්බන්ධයෙන් සිය පළමු හෝ දෙවැනි ප්‍රකාශ කිසිවක් බේරුම්කරණය වෙත යොමු කොට නොමැත.

**ආරාවුලේ පසුබිම.**

මලිඳු සදරුවන් ජයසූරිය මහතා තම්බපණ්නි ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ විධායක සූපවේදී වශයෙන් 2022.01.20 දින සේවයට බැඳී ඇති අතර, ඔහුට ලබාදී ඇති පත්වීම් ලිපියෙහි මුළු වැටුප ලෙසට රුපියල් එක්ලක්ෂ විසිපන්දහසක් ලෙස දක්වා ඉන්පසුව වරහන්තුල එම වැටුප සකස්වී ඇති ආකාරය පිළිබඳව විස්තර දක්වා ඇත. එනම් මූලික වැටුප රු.40,000/-, අයවැය සහන දීමනාව 3,500/- සේවා ගාස්තු රු. 40,000/- සහ බෝනස් රු.41,500 ලෙසට දක්වා තිබුණි.

මෙම සේවකයාට ඔහු සේවයට බැඳුනු මුල් මාසයේ සම්පූර්ණ වැටුප ලබාදී ඇති අතර, ඉන්පසු දීමනා මුදල් අඩු කොට වැටුප් ගෙවා ඇත. මෙසේ අඩුවෙන් වැටුප් ගෙවීම මෙම ආරවුලට හේතුපාදක වී ඇත.

**සාක්ෂි මෙහෙයවීම**

පළමුවෙන්ම පළමු පාර්ශ්වය වෙනුවෙන් පැමිණිලිකාර සේවකයා සිය සාක්ෂිය ලබාදුන් අතර, එම සාක්ෂිය දෙවැනි පාර්ශ්වයේ නීතිඥ මහතා විසින් හරස් ප්‍රශ්න වලට භාජනය කරන ලදී.

මේ අතරතුර පළමු පාර්ශ්වය විසින් සමත යෝජනාවක් දෙවැනි පාර්ශ්වය වෙත ඉදිරිපත්කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් ඇති වූ අතර, පළමු පාර්ශ්වය විසින් සම්පූර්ණ සහ අවසාන සමතයක් වශයෙන් රුපියල් ලක්ෂ තුන (රු. 300,000/-) ක මුදලක් ඉල්ලා සිටි අතර, දෙවැනි පාර්ශ්වය විසින් රුපියල් එක්ලක්ෂ හැත්තැපන් දහස (රු.175,000/-) ක මුදල ගෙවිය හැකි බව පවසන ලදී. දෙපාර්ශ්වය ගෙවන මුදල සම්බන්ධයෙන් එකඟවීමක් නොමැති බැවින් මා විසින් රුපියල් දෙලක්ෂ හැත්තෑ පන් දහස (රු.275,000/-) ක මුදලක් ලබාගෙන ආරාවුල සමතයකට පත්කර ගන්නා ලෙස දැනුම් දෙන ලදී. ඊට ප්‍රතිචාර වශයෙන් දෙවැනි පාර්ශ්වය වන සේවායෝජක පවසා සිටියේ අවසාන සමතයක් ලෙසට රුපියල් දෙලක්ෂ පනස් දහස (රු. 250,000.00)ක මුදලක් ලබාදීමට කැමති බවයි.
මෙම යෝජනාවට පළමු පාර්ශ්විය සේවකයා ද සිය කැමැත්ත පල කරන ලදී. ඒ අනුව ආරාවුල සමතයකට පත්කර ගැනීම සඳහා 2025.06.17 දින පෙරවරු 10.00 ගරු බේරුම්කරණය වෙත පැමිණ අදාල මුදල ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවීමට කටයුතු කරන බව දෙවැනි පාර්ශ්වය දැනුම් දෙන ලදී. ඒ අනුව නියමිත දිනයේ අදාළ මුදල ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් සේවකයා වෙත ගෙවීමෙන් අනතුරුව ආරාවුල සමතයකට පත්කරන ලදී.

**ප්‍රදානය**

වර්ෂ 2025.06.06 දින පැවති පරීක්ෂණ අවස්ථාවේදී එකඟ වූ පරිදි පළමු පාර්ශ්වය වන මලිඳු සදරුවන් ජයසූරිය මහතා විසින් මා වෙත ද පිටපතක් සහිතව දෙවැනි පාර්ශ්වය වන තම්බපණ්නී ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සමූහ සාමාන්‍ය අධිකාරී වෙත යොමු කරන ලද 2025.06.02 දාතමින් යුත් සමත යෝජනාවට ප්‍රතිචාරයක් වශයෙන් දෙවැනි පාර්ශ්වය වන තම්බපණ්නී ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් සම්පූර්ණ සහ අවසාන සමතයක් වශයෙන් රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000/-) ක මුදලක් ගෙවිය හැකි බවට ප්‍රතියෝජනාවක් ඉදිරිපත් කරන ලදී. මෙම ප්‍රතියෝජනාවට සිය එකඟතාවය පළමු පාර්ශ්වය විසින් පලකරන අතර, එකී සමතයට අනුව රුපියල් දෙලක්ෂ පනස් දහසක මුදලක් 2025.06.17 දින මා ඉදිරි පිට දී භාරගෙන මෙම ආරාවුල අවසන් කිරීමට දෙපාර්ශ්වයම එකඟතාවය පලකරන ලද හෙයින්, සමතයක් ලෙස අදාළ යෝජිත මුදල වන රුපියල් දෙලක්ෂ පනස් දහස (රු.250,000/-) ක මුදල දෙවැනි පාර්ශ්වය වන තම්බපණ්නි ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ නියෝජිතයකු විසින් 2025.06.17 දින පළමු පාර්ශ්වයේ මලිඳු සදරුවන් ජයසූරිය මහතා වෙත ගෙවන ලද අතර, අදාළ මුදල නිවැරදිව පළමු පාර්ශ්වය විසින් භාරගෙන ආරාවුල සමතයකට පත්කර ගන්නා ලදී.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමින් ගොනුව පියවීමට නියම කරමි.

**නීතිඥ ඕබඩගේ ලීලාරත්න,**
බේරුම්කරු.

2025 ජූනි මස 23 වැනි දින.

ECG 08-0008